**ඇඹිලිපිටිය අධ්‍යාපන කලාපය**

**විෂය:- මව්බස**

**කාර්ය පත්‍රිකාව :- කාර්ය පත්‍රිකා 6**

**ශ්‍රේණිය:- 3 ශ්‍රේණිය**

- පහත ඡේදය සිසුන්ට සවන්දීමට සලස්වන්න

තිත් මුවෝ **කී**ප දෙනෙක් ඉදිරියට ආහ.ඔවුන් ගමන් ගත්තේ යාම්තමින් පොළොවට පා තබන්නාක් මෙන් ඉතා **නි**සල ව ය. අං තට්ටු කීපයක් දැරූ ලොකු මුවෙක් වැව ඉවුරේ සිට ගෙන , දෙකන් ඒ මේ අත හරවමින් , උදාර ලීලාවෙන් බලා සිටියේය. ඌ රළේ නායකයා වන්නට ඇත.ඌ එසේ සිටිද්දී සෙස්සෝ වැවට බැස දිය **බො**න්නට වූහ. මුව දෙනක් කුඩා පැටවුකුත් සමඟ දියට **බැ**ස්සාය.අනතුරු ව ,මෙතෙක් **වේ**ලා ගොඩ සිටි මුවා ද වැවට බැස්සේය.

(වනගත ළමෝ -ආචාර්ය දොන් පීටර් පියතුමා)

- ප්‍රශ්න අසා වාචිකව පිළිතුරු ලබා ගන්න

1. ඡේදයේ සත්ත්ව වර්ගය කවුද?
2. වැව ඉවුරේ සිටගෙන සිටියේ කවුද?
3. තිත් මුවෝ ගමන් කළේ කෙසේද?
4. මුවදෙන දියට බැස්සේ කොතැනට ද?
5. මුවො දිය බීමට බැස්සේ කොතැනටද?
6. ඡේදයේ ඇති වචනයේ මුල් අකුරට කෙටි ඇද පිල්ල යෙදුනු වචන කියන්න?
7. ඡේදයේ ඉරි ඇඳි අකුරු වල යොදා ඇති පිල්ලම් කියන්න?
8. “එ” ශබ්දයෙන් ආරම්භ වන වචන ඡේදයෙන් සොයා කියන්න?
9. මෙම වචන අසා ලිවීමට දෙන්න?

10. ඡේදයෙන් සොයා වගුව සම්පූර්ණ කරන්න?

| ( ැ)<br>“ඇ” ශබ්දය | (ෙ ා )<br>“ඔ” ශබ්දය | ( ෙ )<br>“එ” ශබ්දය | ( ු ු )<br>“උ” ශබ්දය |
|---|---|---|---|
| | | | |

- නිවැරදි වචනය ලියා හිස්තැන සම්පූර්ණ කරන්න?

11. තිත් මුවන් ගමන් ගත්තේ යාමතමින් ........................පා තැබීමෙනි.

(පොළවට , වැවට)

12. අං තට්ටු කිහිපයක් දැරූ මුවා ........................... විය.

( ලොකු ,නායකයා )

13. මුව රළ ........................... බැස දිය බොන්නට වූහ.

( ගඟට , වැවට )

14. මුව දෙනක් පැටියා සමඟ ..........................බැස්සාය.

(දියට , පොළොවට)

15. මුවරළ .......................... ගමන් ගත්හ.

(සමගියෙන් , අසමගියෙන්)

16. වචනයේ මුල් අකුරට පිල්ලම් ඇති වචන 10 ක් ඡේදයෙන් සොයා ලියන්න.

**එම මුල අකුරට යෙදී ඇති පිල්ලම් නම් කරන්න?**

**1. ......................** **2. ............................**

**2. ......................** **3. ............................**

**5. ......................** **6. ............................**

**7. ......................** **8. ..........................**

**9. ......................** **10. ........................**

**පෙර වැඩ**

- **මෙම ඡේදය හොඳින් තුන් වතාවක් ශබ්ද නගා කියවීමට සලස්වන්න.**

**පසුවැඩ**

- **ඡේදය ලස්සන අත් අකුරෙන් ලියන්න.**

**සැකසීම**

**3 ශ්‍රේණිය බාර ආචාර්ය**

**ර/ඇඹි/ඇඹිලිපිටිය මහා විද්‍යාලයය**